## උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

### උසස් තාක්ෂණ ආයතන සහ ආයතන අංශ සඳහා සිසුන් ඇතුළත් කිරීම - 2018 අධ්‍යයන වර්ෂය

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් මෙහෙයවන උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා 2017 වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂවල අ.පො.ස. (උ. පෙළ) සමත් අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*අයදුම් කරන පිළිවෙළ:*

ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස්කර ගන්නා ලද අයදුම් පත්‍රයක් ඉංග්‍රීසියෙන් සම්පූර්ණ කර රුපියල් පන්සියයක (රු. 500) මුදලක් ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් අංක 025-2-001-1-3397613 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන ගිණුමට බැරකොට ලබාගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතේ අලවා ඔබගේ අයදුම්පත 'ආ' කොටසේ දැක්වෙන ඔබ තෝරා ගත් පාඨමාලා පැවැත්වෙන උසස් තාක්ෂණ ආයතනයට හෝ උසස් තාක්ෂණ ආයතන අංශයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි ඔබ විසින් අයදුම් කරනු ලබන පාඨමාලාවේ නම සඳහන් කළ යුතුය.

එක් ආයතනයකට වඩා අයදුම් කරන්නේ නම්, අයදුම් කරනු ලබන සෑම අයදුම් පත්‍රයක් සඳහාම වෙන වෙනම රුපියල් පන්සියයක (රු. 500) වටිනාකමකින් යුත් කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාළ කොටුව තුළ අළවා අයැදුම්පත් ඉදිරිපත්කළ යුතුය. උක්ත අංක දරන ගිණුමට හැර වෙනත් බැංකු ගිණුමකට බැරකරන ලද කුවිතාන්සි සහිත අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. තම ප්‍රදේශයේ ආයතන සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබාදේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට එනම් 2018.03.16 දිනට පසු ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

"ආ" කොටසෙහි ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අයත් උසස් තාක්ෂණ ආයතන/ආයතන අංශවල පවත්වනු ලබන පාඨමාලා හා ලිපිනයන් දක්වා ඇති අතර, අයදුම්කරුවන් තම සුදුසුකම් හා සරිලන පාඨමාලා තෝරාගත යුත්තේ "අ" කොටසෙහි සඳහන් පාඨමාලා ලැයිස්තුව තුළිනි.

*පාඨමාලා පැවැත්වෙන ආකාරය :*

පූර්ණකාලීන පාඨමාලා සඳහා දේශන සතියේ දිනවල දිවා කාලයේ ද, අර්ධකාලීන පාඨමාලා සඳහා දේශන සති අන්තයේ දිවා කාලයේ ද පැවැත්වේ. සියලුම පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. අර්ධකාලීන පාඨමාලා පැවැත්වෙන්නේ අදාළ ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුක්ත හෝ ස්වයං රැකියාවන්හි නියුක්ත අයට පමණි.

*පාඨමාලා ගාස්තු :*

පූර්ණ කාලීන (Full-time) පාඨමාලා සඳහා ගාස්තු අය කරනු නොලැබේ. අර්ධ කාලීන (Part-time) පාඨමාලා සඳහා සමාසික ගාස්තු (Semester) පහත පරිදි වේ. :

| | |
|---|---|
| උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි. | රු. 5,000 |
| උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - උ. ජා. ඉ. ඩි. | රු. 8,000 |
| උසස් ජාතික තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා - උ. ජා. තො. තා. ඩි. | රු. 12,000 |

*ලියාපදිංචි කිරීම :*

සුදුසුකම් අනුව තෝරා ගත් අයදුම්කරුවන් ලියාපදිංචි වීමේදී අදාල ලේඛනවල මුල් පිටපත් සහ සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.

*නේවාසික පහසුකම් :*

දෙහිවල හා ගම්පහ උසස් තාක්ෂණ ආයතනවල සීමිත කාන්තා නේවාසිකාගාර පහසුකම් සහ අම්පාර හාඩි උසස් තාක්ෂණ ආයතනයේ හා කොළඹ උසස් තාක්‍ෂණ ආයතනයන්හි සීමිත කාන්තා සහ පිරිමි නේවාසිකාගාර පහසුකම් ඇත. මෙම සීමිත පහසුකම් ලබාදෙනුයේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සුදුසුකම්ලත් සිසුන්හට පමණි.

## " අ" කොටස

*එක් එක් පාඨමාලා සඳහා ඇතුළත්වීමට අවශ්‍ය සුදුසුකම් :*

**01. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි.**

**01.1 පූර්ණ කාලීන - කාලය වසර 4 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය යටතේ ආර්ථික විද්‍යාව හා ගිණුම්කරණය විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව සියලුම විෂයයන් එක්වරකදී සමත්ව තිබිය යුතුය.

අ. පො.ස. (සා.පෙ.) විභාගයේදී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම, අ. පො. ස. (උ/පෙළ) විභාගයේදී ආර්ථික විද්‍යාව හෝ ගිණුම්කරණය විෂයයකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීමට විකල්පයක් ලෙස සැලකේ ;

සහ

අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂා විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

01.2 අර්ධ කාලීන - කාලය වසර 4 යි

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය එක් වරකදී සියලුම විෂයයන් සමත් වී තිබීම.

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන -

(*අ*) ගණක ශිල්පීය ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

(*ආ*) ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය (ගණකාධිකරණය) ලබා තිබීම;

*හෝ*

(*ඇ*) ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම;

*සහ*

අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක නියුතු අයෙකු විය යුතුය.

පහත සඳහන් සුදුසුකම් දරන්නන් උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාවේ ප්‍රථම වසරින් නිදහස් කර එම පාඨමාලාවේ දෙවන වසරට බඳවා ගැනීම, ඇතුලත්වීමේ සුදුසුකම් සපුරාලීමේ හා ඉඩකඩ තිබීමේ කොන්දේසියට යටත්ව අනුමත කර ඇත.

(i) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන (ව්‍යාපාර පරිපාලනය/ව්‍යාපාර මූල්‍ය/කළමනාකරණ) පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සමත් ව තිබීම.

(ii) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන උසස් ජාතික වාණිජ්‍යය ඩිප්ලෝමාව දෙවන වසර සමත්ව තිබීම.

(iii) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය මගින් හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික ව්‍යාපාර අධ්‍යයන ඩිප්ලෝමාව සමත් ව තිබීම.

(iv) අදාළ ක්ෂේත්‍රයේ විශ්වවිද්‍යාල උපාධියක් (ගණකාධිකරණ/ව්‍යාපාර පරිපාලන/අලෙවි කළමනාකරණ/මානව සම්පත් කළමනාකරණ/ව්‍යාපාර මූල්‍ය/ව්‍යාපාර වාණිජවේදී) තිබීම.

(v) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ මධ්‍ය පරීක්ෂණය සමත්ව තිබීම.

(vi) වරලත් කළමනාකාරීත්ව ගණකාධිකරණ ආයතනයේ (CIMA-UK ) I සහ II පරීක්ෂණය සමත්ව තිබීම.

(vii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනයේ (AAT) III අදියර පරීක්ෂණය සමත්ව තිබීම;

(viii) සහතිකලත් කළමණාකරණ ගණකාධිකාරි ආයතනයේ (CMA-Sri Lanka) අවසාන විභාගය (ACMA) සමත්ව තිබීම.

***සැලකිය යුතුයි :- උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව - පූර්ණ කාලීන/අර්ධ කාලීන***

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 ප්‍රකාරව බඳවා ගැනීමේ පටිපාටියන්හි දී උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා සහතිකය, පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජවේදී උපාධි සාමාන්‍ය සාමාර්ථයකට විකල්ප අධ්‍යාපනික සුදුසුකමක් ලෙස පිළිගනු ලැබේ.

**02. උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමා - (උ. ජා.ගො.සේ.ඉ.ඩි) පූර්ණ කාලීන - කාලය වසර 3 1/2 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් සහිතව) සියලුම විෂයයන් එක්වරක දී සමත් ව තිබීම.

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට සමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**03. උසස් ජාතික ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා - (උ. ජා. ව්‍යා. ප. ඩි.) පූර්ණ කාලීන — කාලය වසර 2 1/2 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය වාණිජ්‍යය විෂය ධාරාව යටතේ සියලුම විෂයයන් එක් වරකදී සමත් ව තිබීම ;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**04. උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමා- (උ. ජා. වස. මූ. ඩි.) - පූර්ණ කාලීන - කාලය වසර 2 1/2 යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) අ.පො.ස. (උ/පෙළ) විභාගය වාණිජ්‍යය විෂය ධාරාව යටතේ සියලුම විෂයයන් එක් වරකදී සමත් ව තිබීම ;

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**05. උසස් ජාතික පාරිභෝගික විද්‍යාව හා නිපැයුම් තාක්ෂණ ඩිප්ලෝමා - (උ.ජා.පා.වි.නි.තා.ඩි) 03 යි- පූර්ණ කාලීන - කාලය වසර 3 යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) ගෘහ ආර්ථික විද්‍යාව විෂය සහිත ව අ. පො. ස. (උ/පෙළ) ඕනෑම විෂය ධාරාවක් යටතේ සියලුම විෂයයන් එක්වරකදී සමත් ව තිබීම ;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**06. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි. සිවිල් ) - පූර්ණ කාලීන - කාලය වසර 3 1/2යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) අ. පො. ස. (උ/පෙළ) භෞතික විද්‍යා විෂය ධාරාව යටතේ (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් සහිතව) සියලුම විෂයයන් එක්වරක දී සමත් ව තිබීම ;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**07. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි. - විදුලි සහ විද්‍යුත්) පූර්ණ කාලීන - කාලය වසර 3 1/2 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) අ. පො. ස. (උ/පෙළ) භෞතික විද්‍යා විෂයය ධාරාව යටතේ (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් සහිතව) සියලුම විෂයයන් එක්වරක දී සමත් ව තිබීම ;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**08. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි. - යාන්ත්‍රික) පූර්ණ කාලීන - කාලය වසර 3 1/2 යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) අ. පො. ස. (උ/පෙළ) භෞතික විද්‍යා විෂයය ධාරාව යටතේ (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් සහිතව) සියලුම විෂයයන් එක්වරක දී සමත් ව තිබීම ;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**09. උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - (උ.ජා.ඉ.ඩි.)**

**09.1 පූර්ණ කාලීන - කාලය වසර 2 1/2 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් සියලුම විෂයයන් එක්වරක දී සමත්ව වී තිබීම;

*සහ*

(ii) අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍ය විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉංග්‍රීසි භාෂා විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

ඉංග්‍රීසි (විශේෂ) ගුරු පුහුණු සහතිකය හෝ විද්‍යා පීඨ ඩිප්ලෝමා සහතිකය (ඉංග්‍රීසි);

*හෝ*

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලබා තිබීම.

**09.2 අර්ධ කාලීන - කාලය වසර 2 1/2 යි**

සුදුසුකම්වලට අතිරේකව අයදුම්කරුවන් අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක නියුතු අයෙකු විය යුතුය.

**10. උසස් ජාතික ආහාර තාක්ෂණ ඩිප්ලෝමා - (උ.ජා.ආ.තා.ඩි.) පූර්ණ කාලීන - කාලය වසර 2 1/2**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) අ.පො.ස. (උ.පෙළ) විභාගය ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යාව විෂයය ධාරා යටතේ සියලුම විෂයයන් එක් වරක දී සමත් ව තිබිය යුතු ය;

*සහ*

අ. පො. ස. (සා. පෙළ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය විෂයය සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

**11. උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා - (උ. ජා. තො. තා. ඩි.)**

**11.1 පූර්ණ කාලීන - කාලය වසර 2 1/2යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂයය ධාරාවකින් එක් වරක දී සමත්වී තිබීම (ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, වාණිජ්‍යය, තාක්ෂණික සහ කලා (ICT විෂය සඳහා ප්‍රමුඛතාව දෙනු ලබයි.);

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**11.2 අර්ධ කාලීන - කාලය වසර 2 1/2 යි**

11.1 සුදුසුකම්වලට අතිරේක ව අයදුම්කරුවන් අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක නියුතු අයෙකු විය යුතුය.

**12. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා - (උ. ජා. ක. ඩී.) පූර්ණ කාලීන - (කාලය වසර 3 කි).**

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂයය ධාරාවකින් සියලුම විෂයයන් එක් වරක දී සමත්ව තිබීම;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතික පත්‍රය හෝ රාජ්‍ය පරිපාලනය හෝ අලෙවිකරණය සඳහා වූ ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය සමත්වීම;

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**13. උසස් ජාතික ව්‍යාපෘති කළමනාකරණ ඩිප්ලෝමා - (උ. ජා. ව්‍යා. ක. ඩී.) පූර්ණ කාලීන - කාලය වසර 2 1/2යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂයය ධාරාවකින් සියලුම විෂයයන් එක් වරක දී සමත්ව තිබීම;

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**14. උසස් ජාතික ප්‍රමාණ හා මිනුම් සමීක්ෂණ ඩිප්ලෝමා - (උ. ජා. ප්‍ර. මි. ස. ඩි.) පූර්ණ කාලීන - කාලය වසර 2 1/2යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) භෞතික විද්‍යා විෂයය ධාරාව යටතේ (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් සහිතව) සියලුම විෂයයන් එක්වරක දී සමත් ව තිබීම ;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**15. උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා - කෘෂිකර්මය - (උ. ජා. තා. ඩි. කෘෂි) පූර්ණ කාලීන - කාලය වසර 3 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) අ.පො.ස. (උ./පෙළ.) ජීව විද්‍යා විෂයය ධාරාව යටතේ (ජීව විද්‍යාව, රසායන විද්‍යාව, සහ භෞතික විද්‍යාව හෝ කෘෂිකර්මය) යන විෂයයන්ගෙන් විෂයයන් තුනක් සහිතව සියලුම විෂයයන් එක්වරකදී සමත්ව තිබීම;

*සහ*

අ.පො.ස. (සා./පෙළ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**16. උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා - (උ.ජා.ස.ස.ක.ඩි.) පූර්ණ කාලීන කාලය වසර 3 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂයය ධාරාවකින් සියලුම විෂයයන් එක්වරකදී සමත්වීම;

*සහ*

අ.පො.ස. (සා. පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂා විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

සැලකිය යුතුයි.-

- අර්ධ කාලීන අයදුම්කරුවන් අදාල ක්ෂේත්‍රය හා සම්බන්ධ රැකියාවක් හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් තිබිය යුතුය.
- පූර්ණ කාලීන පාඨමාලා සඳහා අවම වශයෙන් මාස හයක (6) කර්මාන්ත පුහුණුවක් ඇතුලත් වේ.
- අර්ධ කාලීන පාඨමාලා සඳහා අවම වශයෙන් මාස හයක (6) ව්‍යාපෘතියක් ඇතුලත් වේ.

"ආ" කොටස

**උසස් තාක්ෂණ ආයතන/උසස් තාක්ෂණ ආයතන අංශ, ලිපිනයන්, දුරකථන අංක හා පවත්වන පාඨමාලා :**

| සංකේත අංකය | ආයතන/ආයතන අංශය | ලිපිනයන් | දුරකථන අංක | පවත්වන පාඨමාලාවන් |
|---|---|---|---|---|
| 01 | හාඩි උසස් තාක්ෂණ ආයතනය, අම්පාර | මහාචාර්ය ඉවන් ඒ. හාඩි මාවත, අම්පාර | 063-2222056<br>063-2223035<br>0718100975<br>0717638653 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි, උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තා. ඩි. (කෘෂි), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ස. ස. ක. ඩි, උ. ජා, ව්‍යා. ක. ඩි. (පූ. කා.) |
| 02 | උසස් තාක්ෂණ ආයතන අංශය, අනුරාධපුරය | අක්කර 111, අනුලා මාවත, පණ්ඩුලගම, අනුරාධපුරය | 025-2234417<br>0716564572<br>0715177580 | උ. ජා. ග. ඩි. (පූ. කා), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ. කා), උ. ජා. ස. ස. ක. ඩි. |
| 03 | උසස් තාක්ෂණ ආයතනය, බදුල්ල | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව්, බදුල්ල | 055-2230218<br>055-2223818<br>0778094573<br>0712347677 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි. උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ. කා), උ. ජා. ඉංග්‍රීසි. ඩි. (පූ. කා.), (උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) උ. ජා. ස. ස. ක. ඩි. |
| 04 | උසස් තාක්ෂණ ආයතන අංශය, මඩකලපුව | කෙලින් වීදිය, කෝවිල් කුලම් නැගෙනහිර, අරයාම්පති, මඩකලපුව | 065-2247519<br>065-2247470<br>0778641182<br>0716376307 | උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා) උ. ජා. තො. තා. ඩි. (පූ. කා), උ. ජා. තො. තා. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ස. ස. ක. ඩි. |
| 05 | උසස් තාක්ෂණ ආයතනය, කොළඹ | අංක 42, රොද්‍රිගු පෙදෙස, කොළඹ 15. | 011-2521152<br>011-2521282<br>0777800909<br>0714970484 | උ. ජා. ඉ. ඩි. (සිවිල්/යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු), උ. ජා. ප්‍ර. මි. ස. ඩි, උ. ජා. ගො. සේ. ඉ. ඩි. |
| 06 | උසස් තාක්ෂණ ආයතනය, දෙහිවල | අංක 51, වෛද්‍ය පාර, දෙහිවල | 011-2738349<br>0718085371<br>0714407665 | උ. ජා. ග. ඩි (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි., උ. ජා. ව්‍යා. ප. ඩි. උ. ජා. තො. තා. ඩි. (පූ. කා), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ව්‍යා. මු. ඩි. උ. ජා. ස. ස. ක. ඩි. |
| 07 | උසස් තාක්ෂණ ආයතනය, ගාල්ල | සිරිධම්ම මාවත, ලබුදූව, අක්මීමන | 091-2246179<br>0771681233<br>0710968530 | උ. ජා. ඉ. ඩි. (සිවිල්/යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු), උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි. උ. ජා. ව්‍යා. ප. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ. කා.), උ. ජා. තා. ඩි. (කෘෂි), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ප්‍ර. මි. ස. ඩි., උ. ජා. ස. ස. ක. ඩි |

| සංකේත අංකය | ආයතන/ආයතන අංශය | ලිපිනයන් | දුරකථන අංක | පවත්වන පාඨමාලාවන් |
|---|---|---|---|---|
| 08 | උසස් තාක්ෂණ ආයතනය, ගම්පහ | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ | 033-2287519<br>033-2292544<br>0715511205<br>0772917792 | උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) උ. ජා. තො. තා. ඩි. (අ.කා.), උ. ජා. තා. ඩි. (කෘෂි), උ. ජා. ආ. තා. ඩි., උ. ජා. පා. වි. නි. තා. ඩි. |
| 09 | උසස් තාක්ෂණ ආයතනය, යාපනය | අංක 665/2 වෙරළ පාර, ගුරුනගර්, යාපනය | 021-2222595<br>021-2229803<br>0718447486<br>0777113664 | උ. ජා. ඉ. ඩි. (සිවිල්/විදුලි ඉංජිනේරු), උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ.කා.) උ. ජා. ඉංග්‍රීසි. ඩී. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ.කා) උ. ජා ස.ස.ක.ඩි. (පූ.කා.), උ. ජා. ව්‍යා. ක. ඩි. (පූ. කා.) |
| 10 | උසස් තාක්ෂණ ආයතනය, මහනුවර | අංක 16, කැප්පෙටිපොල පාර, මහනුවර | 081-2232097<br>0719175285<br>0774538133 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි., උ. ජා. ව්‍යා. ප. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි (අ. කා.) උ. ජා. ස. ස. ක.ඩි. |
| 11 | කෑගල්ල උසස් තාක්ෂණ ආයතනය, කෑගල්ල | බණ්ඩාරනායක මාවත, කෑගල්ල | 035-2221297<br>035-2221713<br>0714848210<br>0716254659 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) උ. ජා. ව්‍යා. ක. ඩි. (පූ. කා.) |
| 12 | උසස් තාක්ෂණ ආයතනය, කුරුණෑගල | අංක 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල | 037-2229583<br>037-2224911<br>0714882528 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා,), උ. ජා. ක. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ස. ස. ක. ඩි. |
| 13 | උසස් තාක්ෂණ ආයතන අංශය, මන්නාරම | අංක 201, පළාත් ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථානය (PESC), තලෙයිමන්නාරම් පාර, මන්නාරම | 023-3122555<br>0767966111 | උ. ජා. ඉංග්‍රීසි ඩී. (පූ. කා.), උ. ජා. ස. ස. ක.ඩි, උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) |
| 14 | උසස් තාක්ෂණ ආයතන අංශය, නාවලපිටිය | පරණ නගර සභා ගොඩනැගිල්ල, නාවලපිටිය | 054-2050634<br>0713702889 | උ. ජා. ඉංග්‍රීසි ඩී. (පූ. කා), උ. ජා. ඉංග්‍රීසි ඩී. (අ. කා.) උ. ජා. ස. ස. ක. ඩි, උ.ජා. ක. ඩි. |
| 15 | උසස් තාක්ෂණ ආයතන අංශය, රත්නපුරය | නව නගරය, රත්නපුරය | 045-2231492<br>045-2231493<br>0718147124<br>0713930219 | උ. ජා. ග. ඩි (අ. කා), උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩී. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩී (අ. කා.), උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩී. (අ. කා.) |
| 16 | උසස් තාක්ෂණ ආයතන අංශය, සමන්තුරේ | උසස් තාක්ෂණ ආයතන මාවත, සමන්තුරේ | 067-2261304<br>0775153500 | උ. ජා. ග. ඩි. (පූ. කා) උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩී. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩී .(අ. කා.) උ. ජා. තො. තා. ඩි.(පූ. කා.) |

| සංකේත අංකය | ආයතන/ආයතන අංශය | ලිපිනයන් | දුරකථන අංක | පවත්වන පාඨමාලාවන් |
|---|---|---|---|---|
| 17 | උසස් තාක්‍ෂණ ආයතනය තංගල්ල | යාය වත්ත, නෙටොල් පිටිය, තංගල්ල. | 047-2241845<br>047-2241846<br>0714491932 | උ. ජා. ග. ඩි (අ. කා), උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) |
| 18 | උසස් තාක්‍ෂණ ආයතනය, ත්‍රිකුණාමලය | කන්නිය පාර, වරෝධය නගර්, ත්‍රිකුණාමලය. | 026-2223232<br>026-2050617<br>0773659589 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) උ. ජා. තො. තා. ඩි. (අ.කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ස. ස. ක. ඩි. |
| 19 | උසස් තාක්‍ෂණ ආයතනය, වවුනියාව | ඒ 9 පාර, වේපන්කුලම් ඕමාන්තෙයි වවුනියාව. | 024-2052733<br>0776162010 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩී. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) |

*සැලකිය යුතුයි :*

(1) අ. පො. ස. (උ.පෙ.) නව නිර්දේශය යටතේ උසස් ජාතික ඩිප්ලෝම පූර්ණ කාලීන පාඨමාලා සඳහා අයදුම්කරන්නන් සාමාන්‍ය පොදු පරීක්‍ෂණය සමත් ව තිබීම අනිවාර්ය වේ.

(2) උසස් ජාතික පා. වි. නි. තා. ඩි./ඉංග්‍රීසි ඩි./ස. ස. ක. ඩි. / තො. තා. ඩි/ආ. තා. ඩි/ක. ඩි/ව්‍යා. ක.ඩි පාඨමාලාවන් හැර අනෙකුත් සියලු පාඨමාලාවන් සඳහා තෝරා ගැනීමේ නිර්ණායක වනුයේ, අ. පො. ස. (උ/පෙ.) හෝ Z-score අගයන් වේ.

(3) උසස් ජාතික පා. වි. නි. තා ඩි./ඉංග්‍රීසි ඩි/ස. ස. ක. ඩි/තො. තා. ඩි/ආ. තා. ඩි/ක. ඩි/ව.ක.ඩි පාඨමාලාවන් සඳහා සුදුසු අයදුම්කරුවන් බඳවා ගැනීමේ දී ආයතන මට්ටමින් ලිඛිත පරීක්‍ෂණයක් පවත්වනු ලැබේ.

(4) පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා වයස අවු. 23ට අඩු අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(5) උසස් තාක්‍ෂණ ආයතනයක ඕනෑම පාඨමාලාවක් පැවැත්වීම සඳහා අවම වශයෙන් අයදුම්කරුවන් 100ක් ලියාපදිංචි වීම අනිවාර්ය වේ.

(6) උසස් තාක්ෂණ ආයතන අංශයක ඕනෑම පාඨමාලාවක් පැවැත්වීම සඳහා අවම වශයෙන් අයදුම්කරුවන් 50ක් ලියාපදිංචි වීම අනිවාර්ය වේ.

(7) අයදුම්පතේ සඳහන් කර ඇති පළමු කැමැත්ත සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

(8) සියලුම පාඨමාලා හදරන සිසුන් සතියේ දිනවල මෙන්ම අවශ්‍යතාවක් මතු වූ විටක දී සති අන්තයේ ඇතැම් දිනවල පන්ති සඳහා සහභාගි විය යුතු ය.

(9) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (පූර්ණකාලීන) පාඨමාලාවේ දේශන පළමු හා දෙවන වසරේ දී සතියේ දිනවල පමණක් ද, තෙවන හා සිව්වන වසරවලදී සති අන්තයේ දී පමණක් පවත්වනු ලැබේ.

(10) උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ (පූර්ණ කාලීන) දේශන පළමු හා දෙවන වසර සතියේ දිනවල ද, තෙවන වසර සඳහා සති අන්තයේ ද පවත්වනු ඇත.

(11) තෝරා ගැනීමෙන් පසු කුමන හේතුවක් මත හෝ පූර්ණ කාලීන සිසුන් අදාළ පාඨමාලාව හැදෑරීම සඳහා වෙනත් උසස් තාක්‍ෂණ ආයතනයකට හෝ ආයතනය අංශයකට මාරු කරනු නොලැබේ.

(12) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ පාඨමාලාවකට ලියාපදිංචි වූ ශිෂ්‍යයෙකුට අදාළ ආයතනය විසින් ලියාපදිංචි වීමට දී ඇති අවසාන දින සිට දින 60ක කාලයක් ඇතුළත විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට හැකිවන පරිදි තම ලියාපදිංචිය අවලංගු කර ගත හැක.

(13) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කමිටුව මගින් නිර්දේශ කරනු ලබන හා පාලක සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් ඇතුළත්වීමේ සුදුසුකම් සලකා බලනු ලැබේ.

ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට 2018 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්‍ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර www.sliate.ac.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2018.03.16 වේ.

ආචාර්ය ඩබ්ලිව්. හිලරි ඊ. සිල්වා,
අධ්‍යක්‍ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය.

*Office use only* – Course Number :........................................

*Specimen Application Form*

**SRI LANKA INSTITUTE OF ADVANCED TECHNOLOGICAL EDUCATION**

**APPLICATION FORM FOR ADMISSION TO HIGHER NATIONAL DIPLOMA COURSES IN YEAR — *2018***
(Please filled in English BLOCK letters)

*Name of the Courses in the Order of Preference*

1. HND......................................................................
2. HND......................................................................
3. HND......................................................................

(Priority will be given to first preference)

1. Name with initials :————.
2. Name/Names denoted by Initials :————.
3. Postal Address :————.
4. Date of Birth : Year :————., Month :————., Date :————.

   Age (as at 16.03.2018) : Years :————., Months :————., Days :————.
5. National Identity Card No. :————.
6. E-mail Address :————.
7. Sex : ————.
8. Administrative District :————. Contact Phone Number :————.
9. (i) Results of G. C. E. (Advanced Level) Examination :

   Year :————, Index No. :————. Medium :————.

| *Subjects* | *Grade* |
|---|---|
| 1. ..................................... | ..................................... |
| 2. ..................................... | ..................................... |
| 3. ..................................... | ..................................... |
| 4. ..................................... | ..................................... |

Common General Paper : Pass/Fail

Aggregate/Z-score of the above examination :————.

(ii) Results of G. C. E. (Ordinary Level) Examination :

Year :————. Index No.:————. Medium :————.

| *Subjects* | *Grade* | *Subjects* | *Grade* |
|---|---|---|---|
| 1. ..................................... | ................................. | 6. ..................................... | ...................................... |
| 2. ..................................... | ................................. | 7. ..................................... | ...................................... |
| 3. ..................................... | ................................. | 8. ..................................... | ...................................... |
| 4. ..................................... | ................................. | 9. ..................................... | ...................................... |
| 5. ..................................... | ................................. | 10. ..................................... | ...................................... |

10. Highest Qualification in English as a subject :————.

11. Only for Part-time Courses
Details of Present Employment/Self Employment :

Post :————.
E. P. F. Number :————.
Place of Work and Address :————.
Date of Appointment :————.
Business Registration Number (BR) :————.
Date of (BR) :————.

I , do hereby declare that I am not following any other full-time course of study in any other state institution. I am aware that my registration will be cancelled at any time during the period of study if it is found that I concurrently follow a full time course at any other state institution or provide false or incorrect information. I do hereby certify that the information furnished here is true and accurate to the best of my knowledge.

————,
Signature of Applicant.

Date :————.

(The bank receipt for Rs. 500 payable to SLIATE should be Affixed below.)

Affix the Bank SLIP for the amount of Rs. 500 credited to the SLIATE account in the Peoples Bank:
Name of the Bank : People's Bank
Branch : Hyde Park Corner Branch, Colombo 02
Account No. : 025-2-001-1-3397613

02-603